# සරුංගල් යාළුවෝ



වෙනුදි මානවඩු

# සරුංගෙල් යාළුවෝ

චෙනුදි මානවඩු

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : | 2023 |
| කර්තෘ | : | වෙනුදි මානවඩු |
| ලිපිනය | : | නො, 149, උඩර්රියගම, පේරාදෙණිය. |
| ISBN අංකය | : | 978-624-206-818-3 |
| පරිගණක පිටු සැකසුම | : | N.S.මානවඩු |

# පිදුම

E book

සංකල්පය තුළින් අපිට

පොත් ලිවීමට මඟ පෙන්වූ

අප පාසලේ

විදුහල්පතිතුමියටත්,

සමන්මලී ගුරු මෑණියන්ටත්,

නිරතුරුව මට සෙවණැල්ලක්

වෙමින් මාව දිරි ගන්වන

අප්පච්චීට

හා

අම්මාටත්

තව ම අකුරු දන්නැති මගේ

චූටි නංගීටත්

මේ පොත

ආදරයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි


එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණායකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි


මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි


ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර
2023 10 20



"රතු පැංචි, කොළ පැංචි, අනේ ඉක්මනට එන්නකෝ, මේ බලන්න, මම ඉන්න තැන අද හරි ම ලස්සන දවසක් .සුළඟත් හොඳට තියෙනවා .ඔයාලත් එන්නකෝ" කියලා. කහ පැංචි යාළුවෝ දෙන්නා ට කතා කළා.

යාළුවෝ දෙන්න සතුටින් අහස දෙසට පා වෙලා ගියා. එයාලා සතුටින් ඒ මේ අත පාවෙලා ගියා. වලාකුළු අතරින් ගියා. කරණම් ගැහුවා.හරිම සතුටින් දවස ගෙවුණා.







කහ පැංචි අර බලන්නකෝ කවුද? එන්නේ කියලා අම්මෝ! මට නං තවත් බෑ ඉන්න. මම යනවා පහළට ඔයාලත් එනවද? නයි පැංචා සරුංගලය ඔන්න එනවා අපි ඉන්න දිහාවට,මම නම් යනවා.කියලා කොළ පැංචි ඉක්මනට පහළට ගියා.

ඇත්ත තමයි කහ පැංචි මමත් යනවා. ඔයාත් එන්න.එයා අපිව කඩලා දමයි. මම නම් හරි ම බයයි එයාට, නයි පැංචා සරුංගලය එයා ලස්සනයි කියලා හරි ම ආඩම්බරෙන්නේ ඉන්නේ. ඒනිසා මමත් යනවා. ඔයත් එන්න, කියා රතු පැංචි සරුංගලයත් යන්න ගියා.

හා හා හා හා.....

අන්න ඔහොම  ගියා නම් කොයිතරම් නම් හොඳ ද? තමනුත් ගියා නම් තමයි හොඳ.  මට ඔය කැත සරුංගල් එක්ක කතාවට එන්න ඕනේ නැහැ. මට තනියම මුළු අහසෙ ම පාවෙන්න ඕනේ. මගේ දිග ම දිග වලිගය අහස පුරා ම පාවෙනවා  දැක්ක ම තමයි ළමයි සතුටු වෙන්නේ. ඔයාලා වගේ කැත අයට ළමයි කැමති නෑ. ඉතිං යනවා යන්න.  කියලා නයි පැංචා සරුංගලය කහ පැංචි ව එළවා ගත්තා.







නයි පැංචා සරුංගලය අහසේ ඒ මේ අත ඈතට ඈතට පාවෙලා ගියා. එයාගේ වලිගය අහස පුරාම රැළි නගමින් පා වෙනවා. පුංචි ළමයි අත්පොඩි ගසමින් සතුටු වෙනවා.

රතු පැංචි, කොළ පැංචි, කහ පැංචි පැත්තකට වෙලා නයි පැංචාගේ රැඟුම් බලා ගෙන හිටියා.



හිටපු ගමන් සුළඟේ වේගය අඩු වුණා. නයි පැංචා කරන්න දෙයක් තිබුණේ නෑ. නයි පැංචා ළඟ තිබුණු ගහක පැටලුනා. එයාව බලමින් සතුටු වුණ ළමයි එයාව අතහැරල යන්න ගියා. නයි පැංචට හරිම දුකයි. එයා අනේ මාව බේරගන්න කියමින් හඬන්න පටන් ගත්තා.යාළුවො තුන්දෙනා මේ දෙස බලා සිටියා.යහළුවන්ට නයි පැංචා ගැන දුක හිතුනා. එයාලා නයි පැංචාට උදව් කරන්න හිතුවා. එහෙම හිතලා තුන්දෙනා ම තමන්ගේ රැලිවලින් අල්ලාගෙන නයි පැංචාව උඩට ඇද්දා. නයි පැංචාගේ දිග වලිගය ඉරිලා ගියා. එයා හෙමින් හෙමින් උඩට ආවා.





නයි පැංචා සරුංගලයට හරි ම දුකයි. ඒ වාගේම ලැජ්ජයි. එයා යහළුවන්ගෙන් සමාව ගත්තා  නයි පැංචා සරුංගලය යහළුවන්ට කිව්වා, මම ආයේ  කවදාවත් මගේ ලස්සන නිසාවත්, හැකියාවන්, නිසාවත් අනිත් අය පහත් කරලා සලකන්නේ නෑ කිව්වා. අද ඉඳන් අපි  හැමෝ ම යහළුවන් වෙමු'යි කිව්වා.

එදා ඉඳන් අහසේ සරුංගල් හතරක් තිබුණා.  ළමුන් ඒවා බලා සතුටු වුණා.  සරුංගල් යාලුවෝ හැමදාම සතුටින්  හිටියා.

පුංචි අපිත් කවමදාවත් අනිත් අයව අඩුපාඩුකම් නිසා කොන් කරන්න හොඳ නැහැ.තමන්ට ඇති දේවල් ගැන ආඩම්බර විය යුතුත් නැහැ.  ඒ වාගේම දම්වැලක පුරුක් මෙන් සමගියෙන් ජීවත් විය යුතුය.

නිමි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023 10 20